**තනතුරු - ඇබෑර්තු**

**ජාතික පොලිස් කොමිෂන් සභාව**

**නීති නිලධාරී (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026**

ජාතික පොලිස් කොමිෂන් සභාවේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**පුරප්පාඩු සංඛ්‍යාව 01**

**01.** බඳවා ගැනීමේ ක්‍රමය

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සඳහා පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා මෙම තනතුර සඳහා බඳවා ගනු ලැබේ. මෙහිදී ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

**02.** අවශ්‍ය සුදුසුකම්

I. අධ්‍යාපන සුදුසුකම් / වෘත්තීය සුදුසුකම්

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම

II. පළපුරුද්ද

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව වසර තුනකට ( 03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛන වල පළපුරුද්ද, ලබා ගත් කාලය, සහතික කරන්නාගේ නිල මුද්‍රාව හා සහතික කල දිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.)

හෝ

- ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ තනතුරක (නීති ක්ෂේත්‍රයේ තනතුරක් යනු, නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිව්රුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වන තනතුරුය) වසර 03කට නොඅඩු පහත දැක්වෙන කාර්යයන් වලට අදාල පළපුරුද්ද ලබා තිබීම.

(a) නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම
(b) ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු
(c) අදාල අණපනත් සම්බන්ධව නෛතික කටයුතු
(d) පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු
(e) විවිධ ව්‍යවස්ථාපිත ආයතන වලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු

(ඉහත ලේඛන ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් නිකුත් කල ලිපියකින් සනාථ කර තිබිය යුතුය)

**සටහන:**

- මූලික සුදුසුකම සනාථ කෙරෙන ලේඛන වල පිටපත් අයදුම්කරු විසින්ම සහතික කර අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය අතර, සේවා කාලය ආරම්භ වන හා අවසාන වන දිනය අයදුම්පත් පත්‍රයේ පැහැදිලිව සඳහන් කල යුතු වේ. අයදුම්පත්‍රය සමඟ සහතික පිටපත් අමුණා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

III. කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම ජාතික පොලිස් කොමිෂන් සභාවේ අවශ්‍යතාව පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

IV. වෙනත්

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

- අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි**

I. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.

II. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. නීති නිලධාරි III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ඇතුලත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

III. අංක 18/2020 දරන 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව, තනතුරට නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ / රාජ්‍ය භාෂා වල ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන අනෙකුත් නියෝගවලට ද, මෙම පත්වීම යටත් වේ.

V. මෙය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන පත්වීමකි.

VI. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා නොදෙන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම් පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

**04. වයස් සීමාව**

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**05. වැටුප් පරිමාණය**

2025.03.25 දිනැති අංක 10/2025 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.82,150 - 10 x 2,400 - 8 x 2,940 - 17 x 3900 - රු. 195,970 (SL – 1 - 2025) වේ. එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එහි උපලේඛනයේ III හි සඳහන් පරිදි වේ. මීට අමතරව දැනට පවතින රෙගුලාසි අනුව ජාතික පොලිස් කොමිෂන් සභා නිලධාරින්ට මූලික වැටුපෙන් 1/5 ක දිරි දීමනාවක් ගෙවනු ලැබේ.

**06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.**

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| I | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | |
| | (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 25 | 25 |
| | (ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබා ගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක් | 20 | |
| | (ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගන්නා ලද, | | |
| | • පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 15 | |
| | • දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | • දෙවන පන්තියේ පහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 07 | |
| | • සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 05 | |
| | (ඈ) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය | 05 | |

සටහන I - නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත පකුණු 05 ලබා දෙනු ලැබේ.

සටහන II - ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

**11**

අතිරේක වෘත්තීය සුදුසුකම් — 35

නඩු වලට අදාල ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්විම

| | නඩු ගොනු කිරීම (එක් නඩුවක් සඳහා) | අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා) |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 2 | 5 |
| අභියාචනාධිකරණය | 2 | 4 |
| මහාධිකරණය | 2 | 3 |
| දිස්ත්‍රික් උසාවි | 4 | 5 |
| විනිශ්චයාධිකාර | 2 | 3 |

සටහන -

ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල නඩු තීන්දු වල පිටපත් හෝ අවසන්වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කල යුතුය.

**III**

භාෂා හැකියාව — 15

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබා ගත් උපාධිය — 15

(ආ) පිළිගත් අන්තර් ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරඟ වලදී (Moot Court Competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව — 12

<u>**තේවල**</u>

I ප්‍රථම ස්ථානය / හොඳම කුසලතාව - 12
II දෙවන ස්ථානය - 10
III තෙවන ස්ථානය / වෙනත් කුසලතා - 08

<u>**කණ්ඩායම**</u>

I ප්‍රථම ස්ථානය / හොඳම කුසලතාව - 10
II දෙවන ස්ථානය - 08
III තෙවන ස්ථානය / වෙනත් කුසලතා - 06

(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ගත් ඩිප්ලෝමාවක් SLQF 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින් / රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500ක පාඨමාලාවක් හදාරන ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලෝමාවක් — 10

(ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ IELTS සමස්ථ ලකුණ 6.5 හෝ ඊට ඉහළ, TOEFL - IBT 79 හෝ ඊට ඉහළ, TOEFL - CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL - PBT 550 හෝ ඊට ඉහළ වීම — 08

| | | | |
|---|---|---|---|
| | (ඉ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ගත් SLQF 2 මට්ටමේ සහතිකයක්<br>**සටහන -** ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 05 | |
| **IV** | තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම<br><br>(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම<br><br>(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබා ගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක්<br><br>(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබා ගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්<br><br>(ඈ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා / පුහුණු වැඩසටහන් වලට සහභාගී වී ලබා ගත් සහතික පත්‍ර (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.)<br><br>**සටහන :** ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 10<br><br><br><br>08<br><br><br><br>05<br><br><br><br>04 | 10 |
| **V** | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාවය<br>තනතුරෙහි භූමිකාව ඉටු කිරීමට උපස්ථම්භ වන අයදුම්කරුගේ **:**<br>• ශක්තීන් (Strength questions) (ලකුණු 02)<br>• අවස්ථානුකූලව තීරණය ගැනීමේ හැකියාව (Situational questions) (ලකුණු 03) හා<br>• දක්ෂතාව (Competency questions) (ලකුණු 10)<br>ඇගයීමට ලක් කිරීම අරමුණු කර ගත් ප්‍රශ්න වලට ලබා දෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | | 15 |
| | **එකතුව** | | **100** |

**07. අපේක්ෂකයාගේ අනන්‍යතාවය:**

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ වූ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.
- සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා මුල් පිටපත්වල සත්‍ය පිටපත් බවට ඔබ විසින්ම **නිසි පරිදි** සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.
- සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.
  - I. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ
  - II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

**08. අයදුම්පත් ඉදිරිපත් කිරීම.**

(අ) අයදුම්පත් **2026. 03.09** දිනට හෝ එදිනට ප්‍රථම **ලේකම්, ජාතික පොලිස් කොමිෂන් සභාව, අංක 09 ගොඩනැඟිල්ල, BMICH පරිශ්‍රය, කොළඹ 07** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 1.0 සිට 4.0 දක්වාත්, දෙවන පිටුව අංක 5.0 සිට 9.0 දක්වාත්, තෙවන පිටුව 10.0 සිට 11.0 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(ඇ) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"ජාතික පොලිස් කොමිෂන් සභාවේ නීති නිලධාරි** තනතුර - (III) සඳහා අයදුම් කිරීම - 2026" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඈ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.82,150/- ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(ඉ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත තමන් සේවය කරන ආයතනයේ ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

(ඊ) මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම.**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10.** පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය ජාතික පොලිස් කොමිෂන් සභාව සතු වේ.

**11.** මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එහිම සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්
ජාතික පොලිස් කොමිෂන් සභාව
අංක 09 ගොඩනැඟිල්ල
BMICH පරිශ්‍රය
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

ජාතික පොලිස් කොමිෂන් සභාව

**<u>නීති නිලධාරී ( විධායක නිලධාරී ශ්‍රේණියේ III ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026</u>**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

අයදුම් කරන මාධ්‍යයට අදාල අංකය කොටුව තුළ ලියන්න.
සිංහල - 2 / දෙමළ -3 / ඉංග්‍රීසි - 4

සටහන - අයදුම් කරන මාධ්‍ය වෙනස් කල නොහැක.

.................................................................................................................................................................

1.0 1.1 සම්පූර්ණ නම (මයා / මිය / මෙය) :
..........................................................................................
(සිංහලෙන් / දෙමළෙන්)
..........................................................................................

1.2 සම්පූර්ණ නම(මයා / මිය / මෙය) :
..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
..........................................................................................

1.3 මුලකුරු සමඟ නම (මයා / මිය / මෙය) :
..........................................................................................
(සිංහලෙන් / දෙමළෙන්)
..........................................................................................
උදා : එම්.ජී.බී.එස්.කේ. ගුණවර්ධන

1.4 මුලකුරු සමඟ නම :
..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
..........................................................................................
උදා : GUNAWARDHANA. M.G.B.S.K

2.0 2.1 ස්ථිර ලිපිනය :
..........................................................................................
(සිංහලෙන් / දෙමළෙන්)
..........................................................................................

2.2 ස්ථිර ලිපිනය :
..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
..........................................................................................

3.0 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ 0
(අදාල කොටුව තුළ ලියන්න) ස්ත්‍රී 1

3.2 විවාහක / අවිවාහක බව : විවාහක - 1
(අදාල කොටුව තුළ ලියන්න) අවිවාහක - 2

3.3 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.4 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.5 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4.0 4.1 දුරකතන අංකය : ස්ථාවර ☐☐☐☐☐☐☐☐☐☐

ජංගම ☐☐☐☐☐☐☐☐☐☐

5.0 අධ්‍යාපන සුදුසුකම් :

| 5.1 උපාධිය | ආයතනය | දිනය |
|---|---|---|
| ....................................... | .............................................................. | ................................. |
| ....................................... | .............................................................. | ................................. |

6.0 ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිව්රුම් දුන් දිනය : ................................................

6.1 ශ්‍රේෂ්ඨාධිකරණයේ දිව්රුම් දීමෙන් පසු වසර 03ක පළපුරුද්ද සම්පූර්ණ කරන ලද දිනය : ..........................................

6.2 රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක වසර 03ක පළපුරුද්ද සම්පූර්ණ කරන ලද දිනය : ..............................................

- **මූලික සුදුසුකම් සනාථ කෙරෙන සහතික / ලේඛන අයදුම්කරු විසින්ම සත්‍ය බවට සහතික කර අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය.**

7.0 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීම අදාල විස්තර :

7.1 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :
..............................................................................................

..............................................................................................

7.2 අතිරේක වෘත්තීය සුදුසුකම් :
..............................................................................................

..............................................................................................

7.3 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :
..............................................................................................

..............................................................................................

7.4 භාෂා ප්‍රවීණතාව :
..............................................................................................

..............................................................................................

- අතිරේක සුදුසුකම් සනාථ කෙරෙන ලේඛන අයදුම්පත හා එවිය යුතු නොවන අතර, එම ලේඛන සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීමට සූදානම් කර තබා ගැනීම අයදුම්කරුගේ වගකීමකි.

8.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු තිබේද?

..........................................................................................................................................................................

9.0 අයදුම්කරුගේ සහතිකය

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබිමට යටත්වන බව මා දන්නා බවත් , සියළු නීතිරීති වලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

.............................................          ......................................................

දිනය          අයදුම්කරුගේ අත්සන

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත්කරනු ලබන ..................................................................... මයා /මිය /මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු / ඇය මා ඉදිරිපිට දී ................................. දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

......................................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

සම්පූර්ණ නම :

තනතුර :

දිනය :

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

11.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

ඉහත විස්තර සඳහන් ............................................................................. මහතා /මිය /මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු / ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණිම සතුටුදායක බවත්, ඔහුට / ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කල හැකි බවත් සහතික කරමි.

.........................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම :

පදවි නාමය :

ලිපිනය :

දිනය :

(නිල මුද්‍රාව යොදන්න)